# සමාජයට අවශ්‍ය නීති* රීති සන්නිවේදනය (අභිලේඛන ඇසුරින්)

**ජේ. සුදර්මා ප්‍රේමසිරි**

සහකාර කථිකාචාර්ය
ඉතිහාස අධ්‍යයන අංශය- කැලණිය විශ්වවිද්‍යාලය
jspsudarma@gmail.com

ලක්දිව මානව සන්නිවේදනයේ ඉතිහාසය පිළිබඳව විමසා බැලීමේදී අභිලේඛනවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එකල සමාජයේ තොරතුරු සන්නිවේදනය කිරීමේ එක් ප්‍රබල මාධ්‍යයක් වශයෙන් අභිලේඛන ප්‍රමුඛ විය. මහජනතාව නිරන්තරයෙන් ගැවසෙන ස්ථානවල මෙම අභිලේඛන පිහිටුවීමට සමකාලීන රාජ්‍ය පාලකයන් ක්‍රියා කර ඇති බව පෙනේ. මෙමඟින් රජයේ අණ පනත්, නීති රීති, ප්‍රදානයන් සන්නිවේදනය කෙරිණි. මානව සමාජයට අවශ්‍ය නීති රීති අභිලේඛන මඟින් සන්නිවේදනය කළ ආකාර විමසා බැලීම මෙහි මූලික අරමුණ වේ. සමාජයේ යහපත උදෙසා පැනවූ නීති රීතිවල ස්වභාවය, නීති කඩ කළ පිරිසට ලබා දුන් දඬුවම් කවරේද යන්න විමසා බැලීම ද මෙහි සෙසු අරමුණු අතර වේ. ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය පරිශීලනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් යොදා ගැනුණි.

ඉපැරණි සමාජ ක්‍රමය කිසියම් නීති රීති මාලාවකට අනුකූලව හැඩ ගැසී පැවති බව පෙනේ. මෙම නීති රීතී ජනතාවට සන්නිවේදනය කිරීමේදී සැලකිය යුතු මෙහෙවරක් අභිලේඛන මිගින් ඉටු වූ බව සඳහන් කළ හැකිය. ජනතාවට සමාජයේ ජීවත් වීමට අවශ්‍ය නීති රීතී සම්ප්‍රදායක් තිබිය යුතුය. එකල එම නීති රීතී ජනතාව අතරට ගෙන යාමේදී පැවති එකම මාර්ගය වූයේ ශිලා ලිපියයි. ඉපැරණි රජ දරුවන් සමකාලීන ජනතාවට පිළිපැදීමට අවශ්‍ය නීති රීති ශිලා ලිපිවල කොටවා ඒවා ජනතාව නිතර ගැවසෙන තැන්වල පිහිටුවනු ලැබීය.

ශිලා ලිපි රාශියක් මිගින් ම ඉපැරණි ජනතාවට සමාජ නීති රීති ගණනාවක් ම දැනුම් දී ඇති බව පෙනේ. මොරගොඩ ටැම් ලිපිය මේ සඳහා නිදසුනක් ලෙස සඳහන් කළ හැකිය. ගමෙහි ජීවත් වන පිරිස අන් අයට ආයුධවලින් පහර දීම වරදක් බව දන්වයි (EZ, Vol I, p. 203). එවැනි පුද්ගලයෙකු ගමේ සිටියහොත් ගමෙන් පිටමන් කළ යුතු බව ද දක්වයි. ගම් වැසියාගේ අරක්ෂාව වෙනුවෙන් බෙහෝ නීති රීති පනවා ඇති බව මේ තුළින් පැහැදිලි වේ. ගම්වැසියා අතර ඇති වන ආරවුල් මැඩ පැවැත්වීම රජුගේ අරමුණ වන්නට ඇති බව සිතිය හැකිය. ගමෙහි ජීවත් වන ගම් වැසියන් වෙනත් ප්‍රදේශවලට නොයා යුතු යැයි නීති පනවා ඇත.

සමාජයේ ජීවත් වන ජනතාව අතර ගැටුම් අවම කර ගැනීමට රජු මේ තුළින් බලාපොරාත්තු වන්නට ඇත. මේවා ජනතාවට දැනුම් දීම තුළින් ජනතාව ඒවා පිළිපැදීමට පෙළඹෙන්නට ඇත. සමාජයේ ජීවත් වූ මිනිසුනට රජු ලබා දුන් ඉඩම් සම්බන්ධයෙන් ඔවුන් පිළිපැදිය යුතු නීති රීති මාලාවක් ද අභිලේඛන තුළින් සමකාලීන ජනතාවට දැනුම් දී ඇති බව පෙනේ. පොළොන්නරුවේ රාජ සභා ටැම් ලිපිය මේ සඳහා නිදසුනක් ලෙස සඳහන් කළ හැකිය. එහි සඳහන් වනුයේ රජු විසින් එක් පුද්ගලයෙකුට ලබා දෙන ඉඩම් හා වරප්‍රසාද සම්බන්ධවයි. එහිදී ඔහු එම ඉඩම් භුක්ති විඳිය යුතු ආකාරය දක්වා ඇත. මෙහි එන රක් නැමැති මහ වෙදනා ද මොහුගේ දරු මුණුබුරන් ද පරම්පරාවෙන් මේ ඉඩමේ පරිභෝජනය කළ යුතු බව දන්වා ඇත. එසේ ම, දෙතිවලක්න ද විසින් සාදවන ලද විහාරයට අවුරුද්දක් පාසා වියළි ඉිගුරු දිය යුතු යැයි දක්වා ඇත. එසේ දීමට අපහසු

වුවහොත් රන් හුයක් දිය යුතු බව දක්වයි (විමලකකිත්ති හිමි ණී 2004 පි. 184). මේ අනුව සමාජයේ පුද්ගලයන් තමන් භුක්ති විඳින ඉඩම ද පරිභෝජනය කිරීමේ දී පිළිපැදිය යුතු නීති රීති මාලාවක් වූ බව පෙනේ. ඒවා සමකාලීන සමාජයේ මහ ජනතාවට දැනුම් දීම තුළින් රජු අපේක්ෂා කරන්නට ඇත්තේ ඉඩම් සම්බන්ධ විය හැකි ගැටලු තත්ත්වය මීග හැරවීම සඳහා විය හැකිය. මෙය සමාජයේ මිනිසුන් ජීවත් වීමේදී අනුගමනය කළ යුතුව තිබූ නීති රීති මාලාවක් බව ද පෙනේ.

එදා සමාජයේ මිනිසුන් නොයෙකුත් වෘත්තීන්වල නිරත වූ බව පෙනේ. විශේෂයෙන් වෙළඳාම ඒ අතර වැදගත් විය. බෙහෝ පිරිසක් තමන්ගේ ජීවිත ගෙන ගියේ කෘෂිකර්මාන්තයට අමතරව වෙළඳාමෙනි. මේ නිසා වෙළඳාම් කරන ජනතාවට ද කිසියම් නිතී රීති මාලාවක් සන්නිවේදනය කිරීමට අභිලේඛන සමත් වී ඇති බව පෙනේ. මේ සඳහා නිදසුනක් ලෙස බදුලු ටැම් ලිපිය සඳහන් කළ හැකිය. පොහොය දිනවල වෙළඳාම් නොකිරීම එකළ පැවති නීතියක් බව පෙනේ.

''........පෙහොද සල් කළාකුගෙන් වැපුදයට්

තෙල් පද්දක් ගන්නා ඉසා........'' (EZ, Vol III, p. 76)

මෙය සමාජයේ ජනතාව සිලවත් පිරිසක් බවට පත් කිරීම සඳහා ගන්නා ලද උත්සාහයක් බව පෙනේ. වෙළඳාම් කිරීමට පමණක් නොව පින් දහම් කටයුතුවලටත් ඔවුන් යොමු කිරීම සමකාලීන රජවරුන්ගේ අරමුණ වන්නට ඇත. එසේම සමාජයේ වෙළඳාම් කරන පුද්ගලයන්ගේ වංචනික ක්‍රියාවන් නතර කරවාලීම සඳහා ද ඇතැම් කරුණු සන්නිවේදනය කර ඇති බව පෙනේ. වංචනික වෙළඳාම් ක්‍රම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම ද යලි එවැනි සිදුවීම් වීම වළක්වා ගැනීම ද රජුගේ බලාපොරොත්තුව වන්නට ඇත. අනුමත නොකරන ලද තරාදිවලින් නොකිරිය යුතුය, වෙළඳාම් නොකළ යුතු ස්ථානවල බඩු නොකිරිය යුතුය. මිලෙන් අඩු කාසිවල වටිනාකම අඩු කොට නොගැනිය යුතු විය. බුලත් පුවක් මණ්ඩපයක තබා විකිණීම කළ යුතු බව දක්වයි. මෙලෙස වෙළඳ නීති රීති ගණනාවක් ම තෝනිගල ශිලා ලිපිය මිගින් සමකාලීන මහජනතාවට දැනුම් දී ඇති බව පෙනේ. සමාජයේ එදිනෙදා නිවෙස්වල ඇතිවන ගැටලු සන්සිඳවීම කළ යුතු ආකාරය පිළිබඳ ව ද තොරතුරු සඳහන් වේ. ගෘහ වාසීන්ගේ නිවෙස්වල ඇතිවන ආරවුල් සම්දරුවන් හරහා විසඳිය යුතුය (EZ, Vol I, p. 77). නිවෙස් තුළ ද සාමය ආරක්ෂා කිරීම රජුගේ බලාපොරොත්තුව වූ බව මේ තුළින් ැහැදිලි වේ. මෙවැනි නීති රීතී පිළිබඳව සමකාලීන ජනතාව දැනුවත් කිරීම තුළින් ඔවුන්ට එදිනෙදා ජීවිතයේ දි මුහුණ පෑමට සිදුවන ගැටලු අවම වන්නට ඇත. මෙවැනි සමාජ නීති රීති ගණනාවක් තෝනිගල ශිලා ලිපිය තුළින් සමකාලීන ජනතාවට රජු දැනුම් දී ඇති බව පෙනේ.

මිහින්තලා පුවරු ලිපිය තුළින් ද විහාරයක් සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාව පිළිපැදිය යුතු නීති රීති මාලාවක් සන්නිවේදනය කර ඇත. භික්ෂු සංඝයාට අයත් ස්ථානවල කුඹුරු ආරාම ආදිය ජනතාව විසින් පරිභෝජනය නොකළ යුතු විය. විහාර භූමියේ සිටින ගම් වැසියන් නිසි පරිදි බිම් බද්ධ ගෙවිය යුතු ය. තුන් දිනකට ලැබෙන නිවාඩු හැර බොහෝ නිවාඩු නොගත යුතුය. විහාරයේ වෙසෙන දාසයන් තමන්ට විහාරයෙන් ලැබෙන දෙයක් මිස වෙනත් යමක් නොගත යුතු ව දක්වා ඇත්තේ,

''........දසුන් ජිවෙල් කොට් දුනුවක් මුත් ඇත්වෙහෙර‍ බද් තුවාක් තන්හි උකස් පමුණු පාට්ට කැර‍ කුම්බූර් අරුබ් ඇයි නො වැලැන්දියැ යුතු.........'' (Ez, Vol I, No.07, p. 90)

මේ ආකාරයට වෙහෙර විහාරවල සේවය කර දුන් දෙයක් ගන්නවා මිස උකස් කර දී, ප්‍රවේණි කොට දී, බදු දී කුඹුරු ආරාම ආදිය පරිභෝජනය නොකළ යුතු බව දන්වයි. වතු පිටිවලට ගොස් අයහපත් ක්‍රියා නොකළ යුතු විය. විහාරයට අයිති ගම් බිම්වල තල, මී එල හට ගන්නා වෘක්ෂ අයිති පිරිස සිය කැමැත්තෙන් පරිත්‍යාග කළහොත් මිස ඒවා කපා නොගත යුතුය. ඔවුන්ගේ සේවාව භික්ෂූන් වහන්සේලාට පහසුවක් වන්නට ඇත. මෙවැනි නීති රීති විහාරගම් වැසියන්ට පැනවීම තුළින් වෙහෙර විහාර සහ සාමාන්‍ය ජනතාව අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැගෙනු ඇත. සමාජයේ ජනතාවට නිරන්තරයෙන් භික්ෂූන් වහන්සේලාගේ සේවාව, පිහිට අවශ්‍ය වේ. මෙවැනි නීති රීති මාලාවක් සන්නිවේදනය කිරීම තුළින් භික්ෂූන් වහන්සේලා හා මහජනතාව අතර

ඇතිවන ගැටලු අවම වේ. දෙපිරිස අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැගෙන්නට ඇත. රටවැසියා සමගි ව තබා ගැනීම ද රජුට පැවරුණ භාරදූර කාර්යයකි. එබැවින් විහාරගම්වල වාසය කරන ජනතාවට පවා කිසියම් නීති රීති මාලාවක් දැනුම්දීම තුළින් අනෙක් රටවැසියා සමග ද සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යාමට පිටිවහලක් වන්නට ඇත.

සමාජයේ මිනිසුන් හට පවරනු ලැබූ නීති රීතීන් අතර රජයේ නිලධාරීන්ට ද නීති රීති පනවා ඇති බව අභිලේඛන මගින් පැහැදිලි වේ. අතීත සමාජයේ යහපත් නිලධාරීන් පිරිසක් ඇති කර ගැනීම රජුගේ අරමුණ වන්නට ඇත. රජයේ නිලධාරීන් ද සාමාන්‍ය ජනතාව මෙන් විහාර සම්බන්ධයෙන් පිළිපැදිය යුතු නීති රීති ගණනාවක් ම අභිලේඛන මගින් දැනුම් දී ඇත්තේ මේ හේතුවෙනි. ඔවුන්ගෙන් භික්ෂූන් වහන්සේලා හට සිදුවිය හැකි අපහසුතා මග හරවාලීමට රජු කටයුතු කළේ මෙලෙස සමාජ සම්මත වූ නීති රීති මාලාවක් පැනවීම තුළිනි. වෙහෙරේ අවශ්‍ය කටයුතු නොකරන්නන්ට විහාරය නිවසක් නොවන බව දක්වයි. කෙතක ප්‍රමාණය ආදායම් ලබන නිලධාරීන්ට මෙම විහාරයේ වාසය කිරීමට තහනම් බව දක්වයි. ස්ත්‍රියක් පෝෂණය කරන්නෙකුට විහාරයේ වාසය කිරීමට තහනම් බව දක්වයි (ශිලා ලේඛන සංග්‍රහය, 2000, පි. 03)

මේ ආකාරයට මහජනතාවට, නිලධාරීන් පන්සල්, වෙහෙර විහාර සමග ගනුදෙනු කිරීමේ දී අනුගමනය කළ යුතු නීති රීති පිළිබඳ ව අභිලේඛන මගින් සන්නිවේදනය කර ඇත. සම්මත නීති රීති මාලාවක් සකස් කිරීම තුළින් ආගමික සිද්ධස්ථාන හා ස්ථාන හා රටේ පොදු මහ ජනතාව අතර සුහදශීලි බවක් ඇති කිරීම පාලකයන්ගේ අරමුණ වන්නට ඇත. කිරිබත් වෙහෙර ටැම් ලිපියෙහි සඳහන් කර ඇත්තේ හතරවන කාශ්‍යප රජු දවස නිලධාරීන් තිදෙනෙකු විසින් පූජා කරන ලද බෙහෙත් ගෙයක් පිළිබඳවයි. මෙයට ඇතුළු විය අය, නොවිය යුතු අය පිළිබඳව දන්වා නිළධාරීන් හට නීති රීති පනවා ඇත.මේ වෙද ගෙට රත්කොල් කැමියන් නම් වූ රජුගේ නිලධාරීන් හට ඇතුළු වීමට තහනම් බව දන්වයි. මෙහි බිම් කැබැල්ලක්වත් නොගන්නා ලෙස ද දන්වයි අයුතු වරදක් කොට මේ වෙද හලට යමෙක් ඇතුළු වුවහොත් ඔහු වෙද ගේ පිටතට ගෙන අල්ලා ගන්නවා මිස වෙද ගේ ඇතුලේ සිට අල්ලා නොගන්නා බව දක්වයි (Ez, Vol I, No.07, p. 159).

සමාජයේ යම් යම් ස්ථානවල නොයෙක් ආකාරයේ සිරිත් විරිත් වත් පිළිවෙත් තිබූ බව පෙනේ. මෙම නීති රීති පනවා තිබෙන්නේ ඒවාට හානියක් නොවන ආකාරයටයි. සමාජයේ ක්‍රියාත්මක වූ නීති රීති ගණනාවක් ම අභිලේඛන තුළින් සන්නිවේදනය කර තිබෙන බව පෙනේ. හතරවන කාශ්‍යප රජුට අයත් අනුරාධපුර පුවරු ලිපිය තුළින් සමකාලීන සමාජයේ මිනිසුන් විසින් පිළිපැදිය යුතු නීති රීති ගණනාවක් ම දක්වා ඇත. විහාර ගම් බිම්වලට අයත් බිම්හි ගස් කොළන් නොකැපිය යුතු බව දක්වයි. එමෙන් ම මෙහෙකරුවන් ගැල් ගොනුන් නොගත යුතු බව දක්වයි. මේවා විහාර ගම් බිම් සම්බන්ධව සමකාලීන වැසියන්ට පැවරූ නීති රීතිය. මේවා ශිලා ලිපි මගින් සන්නිවේදනය කිරීම රජුගේ වගකීම විය. ගහ කොළ නොකැපීම යනු විහාර ගම්වලට අදාළ වීම පමණක් නොව ඒවා මහ ජනතාවට එදිනෙදා ජීවිතයේ දී පවා පිළිපැදිය හැකි පිළිවෙත්ය. මේ නිසා සමාජයට ගැලපෙන සමාජ නීති රීති සමුදායක් අතීතයේ ජනතාවට අභිලේඛන මිගින් සන්නිවේදනය කළ හැකි බව පෙනේ.

කොණ්ඩවට්ටවාන් ටැම් ලිපිය එවැනි සමාජ නීති රීති සන්නිවේදනය කළ තවත් අභිලේඛනයකි. එක් ගමකට අවශ්‍ය භාණ්ඩ තවත් ගමකින් නොගත යුතු බව දක්වා ඇත. කුඹුරු වපුරන්නේ නැතිව බදු ගත් අය ඒවා භුක්ති විඳීම නොකළ යුතු බව දන්වා ඇත. ගම්වල ජීවත් වන ජනතාවට පවා සන්නිවේදනය කිරීම තුළින් සමාජයේ මිනිසුන් අතර සාමය රැකීම අපේක්ෂා කරන්නට ඇත.

## නිගමනය

මානව සන්නිවේදනයේදී අභිලේඛන මඟින් වැදගත් මෙහෙවරක් ඉටු වී ඇති බව කිව හැකිය. පවුල පමණක් නොව විහාරස්ථානය ද කේන්ද්‍ර කොට ගනිමින් මෙම නීතී රීති පනවා ඇත. හුදෙක් මෙමඟින් යහපත්, සංවිධානාත්මක, පක්ෂපාතී සමාජයක් අපේක්ෂා කරන්නට ඇතැයි සිතිය හැකිය.

මෙමඟින් යහපත් සමාජ පරිසරයක් එකල නිර්මාණය වන්නට ඇති බව උපකල්පනය කළ හැකිය.

### ආශ්‍රෙය ග්‍රන්ථ


Epigraphia Zeylanika, Volume I, (1912), Wickramasinghe, D.M.D.Z, Archaelogical Surver of Ceyion, Oxford Univesity Press, London.

Epigraphia Zelanica, Volume III, (1928) Wickramasinghe, D.M.D. Z, Archaelogical Surver of Ceylon, Oxford Univeßity Press London.

ශිලාලේඛන සංග්‍රහය, (1912), වික්‍රමසිංහ සිල්වා, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

විමලකිත්ති හිමි, (2004), ශිලාලේඛන සංග්‍රහය 1, කොළඹ.